| | | |
|---|---|---|
| සුවෙන් පෙරට<br>ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>Zonal Education Office - Minuwangoda |
| | | වාරය - II |
| ශ්‍රේණිය : 6 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 12 පාඩම - ඇවිදින කොළයා |

- පාඩමේ අන්තර්ගතය කෙටියෙන්

  - 'විද්‍යා විනෝද කතා' පෙළෙන් ඇවිදින කොළයා පාඩම උපුටා ගෙන ඇත.
  - 'විද්‍යා විනෝද කතා' පෙළ මාර්ටින් වික්‍රමසිංහ සූරීන් විසින් රචනා කරන ලදී.
  - පරිසරයේ ජීවත්වන සතුන්ගේ බාහිර පෙනුම, ජීවන රටා ආදී සතුන් පිළිබඳ විවිධ විද්‍යාත්මක තොරතුරු මෙම පොත් පෙළෙහි අන්තර්ගතය.
  - මිත්‍රයෝ දෙදෙනෙක් කැලෑවකට ගොස් වලසකුට හසු වූ කතාවක් අප මින් පෙර අසා ඇත.
  - එක් මිනිසෙක් ගසට නැග පණ බේරා ගන්නා විට අනෙක් පුද්ගලයා පණ බේරා ගන්නේ උපායකිනි.
  - මේ ආකාරයට මිනිසුන් පමණක් නොව අන්තරායෙන් ගැලවීමට සතුන් ද විවිධ උපක්‍රම යොදන ආකාරය පාඩම තුළ සඳහන් වේ.

## කොළයා





- මෙම සතා හැඩහුරුකමිනුත් පාටිනුත් කොළයකට සමාන නිසා ඌ 'කොළයා' යන නමින් හඳුන්වයි.

- හැඩහුරුකමින් කොළයකට සමාන වුවත් මේ සතා හට ගන්නේ බිත්තරවලිනි.





- කුරුල්ලන් වැනි සතුන් ගෙන් බේරීම පිණිස  කොළයක හැඩහුරුකමත්, පාටත් ගැනීම ඌට වාසියකි.
- කොළයා, කොළයක හැඩය ගැනීම ඌගේ ආරක්ෂාවට හේතුවක් වුවත්, සමහර අවස්ථාවක ඌගේ විනාශයට ද එය ම හේතු වේ.
- කොළ හැළුණු ගසක් යට සිටිය ද ඌ අපට හඳුනා ගැනීමට නොහැක. එවිට කොළයා මිනිසෙකුගේ පයට පෑගී මරණයට පත් වීමට පවා ඉඩ ඇත.





- පිහාටු හකුලා පිට මැද තබා ගෙන සිටින විට ඌගේ පිහාටු එක්වන තැන කොළයක මැද නාරටියක් වැනි ය.
- කොළයාගේ පිහාටුවල කොළයක මැද නාරටියෙන් දෙපැත්තට ඇඳුණු හීන් නාරටි වැනි ඒවා ද දකින්නට ලැබේ.
- කොල, නිල් සහ ඉදුණු කොළවල පැහැය ඇති කොළයෝ සිටිති.

- කොළයා ගමන් කරන්නේ බඩ ගාන්නාක් මෙනි.
- ඌගේ ආහාරය කොළය.

## කොළයාගේ බිත්තර









- කොළයා කුරක්කන් වපුරන්නාක් මෙන් බිම බිත්තර දමයි.
- ඌගේ බිත්තර කරවිල ඇටවලට සමාන ය.

## විරාම ලක්ෂණ

- විරාමය යනු නැවතීමයි.
- කථනයේ දීත් ලේඛනයේ දීත් විරාමය හෙවත් නැවතීම යෙදේ.
- කථනයේ දී හෙවත් කතාවේ දී හඬ නිසි පරිදි උස් පහත් කිරීමෙන්, අංග චලනයෙන් හා මුහුණේ ඉරියවු මඟින් විරාමය පෙන්වයි.
- ලේඛනයේ දී විරාමය පෙන්නුම් කරන්නේ විරාම ලක්ෂණ මඟිනි.
- ලේඛනයේ දී විරාම ලක්ෂණ භාවිතය අදහස් නිරවුල්ව හා පැහැදිලිව දැක්වීමට උපකාරී වේ.
- තිත, කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ, විස්මයාදි ලකුණ, යුගල උඩු කොමා, තනි උඩු කොමා විරාම ලක්ෂණ කිහිපයකි.

## තිත ( . )

- වාක්‍යයක් අවසානයේ තිත යෙදේ.

  උදා:- ගිරවා අඹ කයි.
  ඔහු ක්‍රීඩා කරයි.

- පුද්ගල නාමයක මුලකුරු දැක්වීමේ දී යෙදේ.

  උදා:- ඩී. එස්. සේනානායක
  එම්. ඒ. එස්. රත්නායක

- වචන කෙටි කර දැක්වීමේ දී යෙදේ.

  උදා:- ලං. ග. ම. - ලංකා ගමනාගමන මණ්ඩලය
  රා. සේ. පි. - රාජ්‍ය සේවය පිණිසයි

- වටිනාකමක් දැක්වීමේ දී, දශම භාග දැක්වීමේ දී,වේලාව සඳහන් කිරීමේ දී, ඉලක්කමෙන් දිනයක් ලිවීමේ දී තිත භාවිතා කරයි.

  උදා:- රු. 5.50යි - රුපියල් පහයි ශත පනහයි
  0.25 - බිංදුවයි දශම දෙකයි පහයි
  පෙ. ව. 8.30 - පෙරවරු අටයි තිහයි
  2010.05.08 - දෙදහස් දහයේ මැයි මස අටවෙනිදා

## කොමාව ( , )

- වාක්‍යයක කෙටි විරාමයක් දැක්වීමට කොමාව යෙදෙයි.

  උදා:- එසේ ය ලබමි, මම මීට බට යටත් පිරිසෙයින් පක්ෂීන් පටන් කිසි කෙනෙකුන් නො හරිමි.

- වාක්‍යයක ආමන්ත්‍රණ පදයක් යෙදෙන්නේ නම් එය වෙන් කර දැක්වීම සඳහා කොමාව යොදයි.

උදා:- දුව, ඉක්මනට එන්න
කුමරුවනි, කිසි විටෙක බිය නොවව.

- පද වෙන්කර දැක්වීමේ දී කොමාව යෙදෙයි.

උදා:- මුවා, හරකා, බල්ලා සිවුපා සතුන් ය.
දෙහි, දොඩම්, නාරං විටමින් සී බහුල පලතුරු ය.

## ප්‍රශ්නාර්ථ ලකුණ ( ? )

- ප්‍රශ්නයක් අසන වාක්‍යවල අවසානයේ ප්‍රශ්නාර්ථ ලකුණ යෙදෙයි.

උදා:- නුඹ කවරකු සොයන්නෙහි ද?
ඔබට අසනීප ද?

## විස්මයාදි ලකුණ ( ! )

- ආමන්ත්‍රණවල දී හා නියෝගවල දී යෙදේ.

උදා:- දරුවනි ! නිශ්ශබ්ද වන්න.
වහා මෙතැනින් පිටත් ව යව!

- ශෝකය පළ කිරීමේ දී යෙදෙයි.

උදා:- නිවන් සුව ලැබේවා!
අනේ ! අපට මොකද වුණේ.

- පුදුම සහගත බව, විස්මය පළ කිරීම සඳහා යෙදෙයි.

උදා:- ෂා! හරිම ලස්සනයි
කෝ ! කවුද එන්නේ

- ආශිර්වාදයක්, ප්‍රාර්ථනාවක් හෝ සුබ පැතුමක් කිරීමේ දී යෙදෙයි.

උදා:- සුවපත් වේවා !
බුදු සරණයි !

## යුගල උඩු කොමා ( “ ” )

- යම් අයෙකු විසින් කළ ප්‍රකාශයක් ඒ අයුරින් ම ලිවීමේ දී යෙදෙයි.

  උදා:- “ අම්මා එක්ක යන්නේ මම ය” යි ඉදිරියෙන් ගමන් කරන පියදාසට ශරත් කීවේ ය.

- යම් කරුණක් විශේෂ කොට දැක්වීමට අවශ්‍ය අවස්ථාවල දී යෙදේ.

  උදා:- “ විද්‍යා ප්‍රබන්ධ ” යනු යම් කිසි ගවේෂණශීලී විද්‍යාත්මක අත්දැකීමක් රසවත් අයුරින් ලියා ඇති කතාවකි.

- උද්ධෘත පාඨ සඳහා යෙදේ.

  උදා:- “ කියවීම මිනිසා සම්පූර්ණ කරයි ” යනුවෙන් සඟරාවක සඳහන් කර තිබුණි.

## තනි උඩු කොමා ( ‘ ’ )

- උද්ධෘත පාඨයක ඇතුළත තවත් උද්ධෘත පාඨයක් දැක්වීමට යෙදේ.

  උදා:- නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකට, පුරෝගාමී ලේඛකයකු වන කේ. ජයතිලකගේ ‘ පුංචි පැළේ ගස වෙනා ’ කෘතිය ස්වයං චරිතාපදානයකැයි කිය හැකිය.

- **පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) 1. ‘ඇවිදින කොළයා’ පාඩම උපුටා ගෙන ඇත්තේ කවර ග්‍රන්ථයකින් ද?

2. එම ග්‍රන්ථය ලියූ රචකයාගේ නම කුමක් ද?

3. මාර්ටින් වික්‍රමසිංහ මහතා රචනා කළ වෙනත් කෘති දෙකක් ලියන්න.
4. ඇවිදින කොළයාට ඒ නම ලැබී තිබෙන්නේ කුමන හේතුවක් නිසා ද?
5. එම සතාට ලැබී ඇති පෙනුම නිසා ඌ ලබන වාසියක් හා අවාසියක් ලියන්න.
6. කොළයා බිත්තර දමන්නේ කෙසේ ද?
7. කොළයාගේ සතුරන් සේ සඳහන් වන්නේ  කවුරුන් ද?
8. කොළයා ආහාරයට ගන්නේ මොනවා ද?
9. කොළයා කුමන වර්ණවලින් යුක්ත ද?
10. පාඩමෙන් ඔබට හමු වූ උපමා දෙකක් ලියන්න.

## (02) සමාන පද තෝරා යා කරන්න.

| | |
|---|---|
| අන්තරාය | කෝෂයක් |
| කපටි | පත්‍ර |
| විවිධ | විස්මය |
| කුරුල්ලා | පියාපත් |
| විනාශය | අනතුර |
| පුදුම | නොයෙක් |
| පිහාටු | පක්ෂියා |
| කොපුවක් | වංක |
| බිත්තර | ව්‍යසනය |
| කොළ | බීජ |

(3). පහත සඳහන් පදවලට විරුද්ධ පද පාඩමෙන් උපුටා ලියන්න.

1. සතුරෝ -
2. අමනුෂ්‍යයා -
3. නිවැරදි -
4. ලොකු -
5. අවංක -
6. නොමළ -
7. අසමාන -
8. නොඉදුණු -
9. අභ්‍යන්තර -
10. ඇතිව -

(4). පහත සඳහන් ප්‍රකාශ හරි නම් <u>හරි</u> ලකුණ ද වැරදි නම් <u>වැරදි</u> ලකුණ ද යොදන්න.

1. කොළයකට සමාන නිසා කොළයා යැයි කියයි. ( )
2. කොළයා හට ගන්නේ කොළවලිනි. ( )
3. කොළ හැළුණු ගසක් යට සිටින විට කොළයා අපට පහසුවෙන් හඳුනා ගත හැකිය. ( )
4. කුරුල්ලෝ කොළයාගේ සතුරෝ ය. ( )
5. කොළයා ඇවිද යන්නේ ඉතා වේගයෙනි. ( )
6. කොළයාගේ බිත්තර කරවිල ඇටයක හැඩය ගනී. ( )

## (5) පහත ප්‍රකාශවල ඒ ඒ තැනට සරිලන විරාම ලක්ෂණ යොදන්න.

1. දරුව හොඳට ඉගෙන ගන්න
2. කමල් නිමල් සුනිල් පියල් සහ රවී අද පාසල් ගොස් නැත
3. අයියෝ ඔහු මැරිලා නේද
4. සිංහලයිනි නැගිටිව් බුද්ධගයාව බේරා ගනිව් යනුවෙන් අනගාරික ධර්මපාලතුමා ප්‍රකාශ කළේ ය
5. අලි උවදුර පාඩම උපුටා ගත්තේ කවර ග්‍රන්ථයකින් ද
6. සියලු සත්වයෝ නිදුක් වෙත්වා
7. අපොයි  අපට වෙච්ච දෙයක්
8. සුදත් ඊයේ දුන්නු ගණන් හැදුවා ද
9. මම ගෙදර පැමිණ මුහුණ සෝදාගෙන කෑම කෑවෙමි
10. බෝධිසත්වයෝ අපි තොප විසින් අප හැම දෙනා කෑ නොදෙම්හ යි කිවූය

ඩබ්.ජී.සී.කේ. හඟුරන්කෙත මිය
ගුරු උපදේශිකා (සිංහල)